සාමාන්‍ය සමය දසඅටවන ඉරුදින | **දේව ප්‍රකාශන** | 05-08-12

## පළමුවන කියැවීම

නික්මයාම 16:2-4,12-15

නික්මයාම පොතෙන් ගත් පාඨයෙකි.

**"මම නුඹලාට අහසින් ආහාර වස්වමි."**

ඉශ්රායෙල් ජනයා මෝසෙස්ට හා ආරොන්ට විරුද්ධ ව පාළුකරයේ දී මැසිවිලි කියන්නට වූහ. ඔව්හු ඔවුනට කතා කොට, "මිසර දේශයේ දී සමිඳාණන් වහන්සේගේ අතින් අපි මැරුණෙමු නම් කොතරම් යහපත් ද? එහි දී අපට, මස් පිරුණු බඳුන් ළඟ වාඩි වී, ඇති තරම් කෑම කන්නට පුළුවන්කම තිබිණි. එහෙත් ඔබ මේ මුළු ජනතාව සාගින්නෙන් මරා දැමීමට මේ පාළුකරයට ගෙනාවහු ය"යි කීහ. එවිට සමිඳාණන් වහන්සේ මෝසෙස්ට කතා කොට මම නුඹලාට අහසින් ආහාර වස්වමි. දිනපතා මිනිසුන් නික්ම ගොස් එදිනට අවශ්‍ය කොටස එකතු කර ගත යුතු ය. මෙසේ ඔව්හු මාගේ නීතිය පිළිපදින්නෝ ද නැද්ද කියා මට ඔවුන් පරීක්ෂාකළ හැක. ඉශ්රායෙල් ජනයාගේ මැසිවිලි මට ඇසිණි, නුඹ ඔවුන් අමතමින්, 'සවස ඔබ මාංශ කන්නහු ය. උදය ඔබට ඇති තරම් පුප ලැබෙන්නේ ය. මෙසේ නුඹලාගේ දෙවි සමිඳාණන් වහන්සේ මා බව නුඹලා දැනගන්නහු ය'යි කියන්නැ"යි පැවසූ සේක. ඉන්පසු සවස් කාලයේ දී වටවුන් වර්ගයක් අවුත් කඳවුර වසාගති. උදය කාලයේ දී කඳවුර සිසාරා පිනි තට්ටුවක් විය. පිනි වාෂ්ප වී ගිය පසු පාළුකරයේ භූමිය මතු පිට සිහින් වූ, කුඩා වටකුරු හිම වැනි දෙයක් තිබෙනු ඔව්හු දුටුහ. මෙය දුටු ඉශ්රායෙල් ජනයා එකිනෙකාට කතා කරමින්, "මෙය කුමක් ද"යි විචාළාහ. මන්ද, ඒ කුමක් ද කියා ඔවුන් නොදත් බැවිනි. මෝසෙස් ඔවුන්ට පිළිතුරු දෙමින් "මෙය වනාහි සමිඳාණන් වහන්සේ ඔබට අනුභව කිරීමට දුන් ආහාරය වේ ය"යි කීවේ ය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 78:3-4, 23-25, 54

පිළිතුර: සමිඳුණෝ ඔවුන්ට අහසින් මන්නා වැසි වැස්වූ සේක.

ගීය: අප අසා දැනගත් දේවල් ද අපේ පියවරුන් අපට දන් වූ දේවල් ද අපි දන්වන්නෙමු. දරු මුනුබුරන් කෙරෙන් නොසඟවා ඊළඟ පරපුරට දන්වන්නෙමු. සමිඳුණන්ගේ ප්‍රබල ක්‍රියා හා බල මහිමය ද එතුමන් කළ හාස්කම් ද කියා පාන්නෙමු.

එතුමාණෝ ඉහළ අහසට කතා කළ සේක. සුරලොව දොරටු විවෘත කළ සේක. ඔවුන්ට කෑමට මන්නා වැසි වැස්වූ සේක. සඟලොවින් ධාන්‍ය ප්‍රදානය කළ සේක.

දෙව් දූතුන්ගේ ආහාර පොදු ජනතාව අනුභව කළහ. එතුමාණෝ පමණටත් වඩා ආහාර පාන එවූ සේක. එතුමාණෝ තම ශුද්ධ දේශයට ඔවුන් ගෙනා සේක. තම බලයෙන් දිනා ගත් කන්දට ඔවුන් ගෙනා සේක.

## දෙවන කියැවීම

එපේසි 4:17,20-24

ශුද්ධ වූ පාවුලු අපෝස්තුළු තුමන් විසින් එපේසිවරුන්ට ලියන ලද හසුනෙන් කොටසකි.

**"දෙවියන් වහන්සේගේ ස්වරූපය අනුව මවන ලද අළුත් ස්වභාවය පැළඳ ගන්න."**

එබැවින්, ස්වාමීන් වහන්සේගේ නාමයෙන් මම තදින්ම ඔබට මෙසේ කියමි. පුහු අදහස් ඇති මිසදිටුවන් මෙන් තවත් නොහැසිරෙන්න. එහෙත් ක්‍රිස්තුස් වහන්සේගෙන්

ඔබ ඉගෙනගත් දේ එවැන්නක් නොවේ. සැබැවින් ම උන් වහන්සේ ගැන ඔබ ඇසුවා පමණක් නොව, කිතුණුවන් වශයෙන් උන් වහන්සේ තුළ වූ සත්‍යය ද ඔබට උගන්වන ලදී. එබැවින් ඔබේ පසුගිය පැවැත්මට අයිති වූ තෘෂ්ණා වලින් මුලා වී විනාශ වන්නා වූ පරණ ස්වභාවය අහක දමා, අධ්‍යාත්මික නවතාවයක් ඇති කර ගන්න. දෙවියන් වහන්සේගේ ස්වරූපය අනුව මවන ලද ධර්මිෂ්ඨකමින් ද ශුද්ධවන්තකමින් ද ප්‍රකාශ වන අළුත් ස්වභාවය පැළඳ ගන්න.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**<u>සාධුකාරය</u>** මතෙව් 4:4

ආලේලූයා! ආලේලූයා!

"මිනිසා ජීවත් වන්නේ තැමෙන් පමණක් නොව

දෙවියන් වහන්සේගේ මුවින් නික්මෙන සියලු වචන වලින් ය"යි ස්වාමින් වහන්සේ වදාරන සේක.

ආලේලූයා!

**<u>ශුද්ධවූ සුවිශේෂය</u>** ජුවාම් 6:24-35

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**"මා වෙත පැමිණෙන යමෙක් වේද, ඔහුට සාගිනි නොවන්නේය. මා අදහන යමෙක් වේද, ඔහුට කිසි කලෙකත් පිපාසය නොවන්නේ ය."**

ජේසුස් වහන්සේවත්, ශ්‍රාවකයන්වත් එහි නොසිටි බව සමූහයා දුටු කළ, ඔවුහු ඒ ඔරු වලට නැඟී ජේසුස් වහන්සේ සොයමින්, කපර්ණවුමට පැමිණියාහ. මුහුදෙන් එගොඩ දී උන්වහන්සේ හමු වී, "ගුරුදේවයෙනි, ඔබ මෙහි වැඩියේ කොයි වේලේද" යි ඔව්හු ඇසූහ. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, "ඒකාන්තයෙන් මම ඔබට කියමි, ඔබ මා සොයන්නේ හාස්කම් දුටු නිසා නොව, රොටී කා තෘප්තියට පැමිණි නිසාය. නැති වී යන ආහාරය සඳහා නොව, සදාතන ජීවනයට ඉවහල් වන ආහාරය සඳහා වීර්ය වඩන්න. මේ ආහාරය ඔබට ප්‍රදානය කරන්නේ මනුෂ්‍ය-පුත්‍රයාණෝ ය. පියාණන් වන දෙවියන් වහන්සේ අධිකාරි බලයේ මුද්‍රාව තබා ඇත්තේ උන්වහන්සේ කෙරෙහි ය"යි වදාළ සේක. එබැවින් ඔව්හු, "දෙවියන් වහන්සේගේ අභිප්‍රාය අනුව වැඩ කරන පිණිස අප කුමක් කටයුතු දැ"යි ඇසූහ. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින්, "දෙවියන් වහන්සේගේ අභිප්‍රාය වනුයේ, උන්වහන්සේ එවා වදාළ තැනැත්තාණන් ඔබ විසින් අදහාගැනීමය" යි වදාළ සේක. එවිට ඔව්හු, "එසේ නම්, අප විසින් දැක අදහාගන්නා පිණිස ඔබ කවර හාස්කමක් දක්වන සේක්ද? කවර ක්‍රියාවක් කරන සේක්ද? අපේ පියවරු පාළුකරයෙහිදී මන්නා කෑහ. 'බුදින පිණිස එතුමෝ ඔවුන්ට ස්වර්ගයෙන් ආහාර සැපයූහ'යි ලියා ඇතැ"යි උන්වහන්සේට කීහ. එවිට ජේසුස් වහන්සේ, "ඒකාන්තයෙන් මම ඔබට කියමි, ස්වර්ගයෙන් ඔබට ආහාරය දුන්නේ මෝසෙස් නොවේ; ස්වර්ගයෙන් සැබෑ ආහාරය දෙන්නේ මාගේ පියාණන් වහන්සේය. මන්ද, දෙවියන් වහන්සේ දෙන ආහාරය වනාහි, ස්වර්ගයෙන් පහළ වී ලෝකයට ජීවනය දෙන ආහාර ය"යි වදාළ සේක. ඔව්හු ද, "ස්වාමිනි, ඒ ආහාරය නිතරම අපට දුන මැනවැ"යි කීහ. ජේසුස් වහන්සේ කතා කොට, "ජීවනදායක භෝජනය මමය, මා වෙත පැමිණෙන යමෙක් වේද, ඔහුට සාගිනි නොවන්නේය. මා අදහන යමෙක් වේද, ඔහුට කිසි කලෙකත් පිපාසය නොවන්නේ ය"යි වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.